# GOVERNMENT
# &
# BUSINESS
# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# රජයක ආර්ථික අරමුණු

## ආර්ථික වර්ධනය හා සංවර්ධනය

නිෂ්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩ වර්ධනය තුළින් ආර්ථික වර්ධනයක් සිදු වන අතර ඊට අමතර ව මානව හා සමාජ දර්ශකවල දිගුකාලීන වර්ධනය සංවර්ධනය ලෙස හඳුන්වයි.

## පූර්ණ සේවා නියුක්තිය

ශ්‍රමය සැපයීමට බලාපොරොත්තුවෙන් සිටින සියලු දෙනා යම් සේවාවක නියුක්ත වී සිටීම මෙන් ම ආර්ථිකය සතු සියලු ම නිෂ්පාදන සම්පත් ඵලදායී නිෂ්පාදන කටයුත්තක යොදවා තිබීම

## සාධාරණ ආදායම් ව්‍යාප්තිය

රටක සමස්ත නිෂ්පාදිතය ඒ රටෙහි වෙසෙන සමස්ත ජනතාව අතර සමාන ව බෙදා හැරීම

## ආර්ථික ස්ථායිතාව

ආර්ථිකයේ දේශීය හා විදේශීය වශයෙන් අර්බුදයක් ඇති නො වීමට ඔරොත්තු දීමේ හැකියාව ආර්ථික ස්ථායිතාවයි.

ආර්ථික ස්ථායිතාව කොටස් දෙකකින් යුක්ත වේ.

1. අභ්‍යන්තර මිල ස්ථායිතාව
2. බාහිර මිල ස්ථායිතාව

ClassWork.LK

## අභ්‍යන්තර මිල ස්ථායිතාව

අභ්‍යන්තර මිල ස්ථායිතාව තුළින් උද්ධමනය පාලනය, මිල මට්ටම ස්ථාවර ව පවත්වා ගැනීම, පොලී අනුපාතය පාලනය කිරීම සිදු කෙරෙන අතර,

## බාහිර මිල ස්ථායිතාව

බාහිර මිල ස්ථායිතාව තුළින් විදේශ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සිදු කෙරේ.

## යහපත් අන්තර් ජාතික වෙළෙඳාම

විදේශ වෙළෙඳ කටයුතු සතුටුදායක අන්දමින් පවත්වා ගෙන යාම තුළින් ගෙවුම් ශේෂ තත්ත්වය ආරක්ෂා කර ගැනීම මින් අපේක්ෂා කෙරේ.

ClassWork.LK

# රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර දායක වන ආකාරය

## බදු ගෙවීම

රජයට ගෙවිය යුතු බදු පැහැර හැරීමකින් තොර ව තමා උපයාගත් ලාභය හා ආදායම් මත නියමිත පරිදි බදු ගෙවීම

## දේශීය සම්පත් භාවිතය

හැකිතාක් උපරිමයෙන් තම නිෂ්පාදන සඳහා දේශීය සම්පත් යොදා ගැනීම.

## රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම

රජය ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා පිළිපැදීම

## නීති රීති පිළිපැදීම

ව්‍යාපාර සඳහා පනවා ඇති නීති රීති ඒ ආකාරයෙන් ඉටු කරමින් යහපත් ව්‍යාපාරික පරිසරයක් ගොඩනැගීමට දායක වීම

ClassWork.LK

## සේවා නියුක්තියට දායක වීම

ඵලදායි ලෙස නිෂ්පාදන කටයුතු කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ඇතුළු සියලු සම්පත් කාර්යක්ෂම ව භාවිතයට ගැනීම

## පරිසරයට වන හානිය අවම කිරීම

සියලු ව්‍යාපාර පරිසර හිතකාමී ලෙස ඒවායේ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම

ClassWork.LK

## රජය හා ව්‍යාපාර අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවක් පවත්වා ගැනීම වැදගත් වන ආකාරය

- රජය හා ව්‍යාපාර අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවක් පවත්වා ගැනීම වැදගත් වේ. රජය ව්‍යාපාරවලට අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ව්‍යාපාර දිරිමත් වේ. ව්‍යාපාර වර්ධනය තුළින් රජයේ අරමුණු ඉටු වේ.

- එසේ ම ව්‍යාපාර වර්ධනය නිසා රජයට බදු ආදායමක් ලබා ගත හැකි ය. එම ආදායම් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා හා අනෙකුත් කාර්යයන් සඳහා යොදාගත හැකි ය. මේ නිසා රජයත් ව්‍යාපාරත් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම අවශ්‍ය වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura